**ඉමදූව ප්‍රාදේශීය සභාවේ**

**ගාල්ල දිස්ත්‍රික්කය**

**----------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**---------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

**--------------------------------**

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 31 දින ද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 31 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, 2016 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 නොවැම්බර් 10 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

**--------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට ඉමදූව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සමුච්චිත අරමුදල් ගිණුමේ ශේෂය රු.130,330 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) වටිනාකම රු.5,349,300 ක් වූ ඉමදූව බස් නැවතුම්පොල ඉඩම හා පොල භූමිය යන වත්කම් ගිණුම්ගත කර නොතිබුණි.

#### 1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

**--------------------------**

මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් එකතුව රු.6,861,622 ක් වූ ගිණුම් විෂයයන් 05 කට අදාළ ශේෂ සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන අනුව දැක්වෙන ශේෂ අතර නිරීක්ෂණය වූ අසමානතා වල එකතුව රු.1,754,691 ක් විය.

#### 1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

**-----------------------------------**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) එකතුව රු.20,272,296 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂ 04 ක් සමාලෝචිත වර්ෂයේදීත් නිරවුල් කරගෙන නොතිබුණි.

(ආ) එකතු වටිනාකම වූ රු.21,368,613 ක් වූ ගෙවිය යුතු ප්‍රාග්ධන වියදම් නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි.

**1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

-----------------------------------

රු.5,349,320 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් හිමිකම් ඔප්පු, රු.63,854,730 ක් වූ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ, මෝටර් රථ හා කරත්ත, ලී බඩු හා සවිකිරීම් හා පුස්තකාල පොත් සම්බන්ධයෙන් යාවත්කාලීන කරන ලද වත්කම් පන්ති අනුව පිළියෙල කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය සහ උපලේඛන ද, රු.63,814,959 ක් වූ හිඟහිටි වෙනත් ආදායම් හා රු.49,728,661 ක් වූ ණයහිමි ශේෂ සම්බන්ධයෙන් විධිමත් පරිදි පවත්වන ලද ණයගැති හා ණයහිමි ලේඛන ද, ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේ දී ඒවා සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

**1.3.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

----------------------------------------------------------------

පහත දැක්වෙන නීති, රීති සහ රෙගුලාසි විධිවිධානවලට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේ දී නිරීක්ෂණය විය.

| නීති, රීති රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 570((1)(2) | සමාලෝචිත වර්ෂයේ අවසානයට වර්ෂ 2 ක කාලය ඉක්ම වන ලද රු.4,120,439 ක තැන්පත් පිළිබඳව කටයුතු කර නොතිබුණි. |

**2. මූල්‍ය සමාලෝචනය**

-----------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

---------------

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.3,884,360 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා අඩු වූ ආදායම රු.1,254,889 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේ දී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.5,139,249 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

**2.2 ආදායම් පරිපාලනය**

----------------------

**2.2.1 වරිපනම් හා බදු**

------------------

සමාලෝචිත වර්ෂයට සහ ඉකුත් වර්ෂවලට අදාළව අයකර ගතයුතුව තිබුණු රු.426,123 ක් වූ වරිපනම් බදු මුදලින් සමාලෝචිත වර්ෂය තුළ සියයට 31 ක් පමණක් අය කරගෙන තිබූ අතර, 1999 වර්ෂයෙන් පසුව වරිපනම් තක්සේරුවක් සිදු නොකිරීම නිසා ලැබිය යුතු වරිපනම් ආදායම් සභාවට අහිමි වී තිබුණි.

**2.2.2 අක්කර බදු**

-------------

ඉකුත් වර්ෂය සහ සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අයකර ගතයුතු රු.64,246 ක් වූ අක්කර බදු මුදලින් වර්ෂය තුළ අය කරගෙන තිබුණේ රු.5,537 ක් පමණි. හිඟ අක්කර බදු අයකර ගැනීම සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1)(අ) වගන්තිය පරිදි කටයුතු කර නොතිබුණි.

**2.2.3 බලපත්‍ර ගාස්තු සහ ව්‍යාපාර බදු**

--------------------------------

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂවලට අදාළව අයකර ගතයුතුව තිබූ බලපත්‍ර ගාස්තු හා ව්‍යාපාර බදු වටිනාකම පිළිවෙලින් රු.274,566 ක් හා රු.864,450 ක් විය. සමාලෝචිත වර්ෂයේ වෙළඳ බලපත්‍ර ගාස්තු අයවීම සියයට 42 ක් හා ව්‍යාපාර බදු අයවීම් සියයට 61 ක් වූ අතර, වර්ෂය අවසානයට වූ හිඟ බදු මුදල් අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159(1) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2016 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු.900,304 ක් ලැබිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

-----------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) අනියම්, තාවකාලික, ආදේශක හා කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණු සේවකයින් 11 දෙනෙකුගේ වැටුප් හා දීමනා ගෙවීම සඳහා රු.2,915,105 ක් සභා අරමුදලින් වැයකර තිබුණි.

(ආ) වාර්ෂික ස්ථාන මාරු ක්‍රමයක් ක්‍රියාත්මක නොවීම නිසා ආයුර්වේද වෛද්‍යවරියක වසර 10 ක් ද, සංවර්ධන සහකාර නිලධාරීන් තිදෙනෙක් වසර 10 සිට 18 දක්වා කාලයක් ද, තාක්ෂණ සේවා නිලධාරියෙකු වසර 07 ක කාලයක් ද, කළමනාකරණ සහකාර නිලධාරිණියක වසර 10 ක කාලයක් සහ පෙර පාසල් ගුරුවරියක වසර 15 ක කාලයක් අඛණ්ඩව සභාවේ සේවයේ යෙදී තිබුණි.

(ඇ) සභාවේ කාර්යාල කාර්යය සහායක තනතුරට බඳවාගත් සේවකයින් පස් දෙනෙකු, වැඩ පරීක්ෂක, උප කාර්යාලය භාරව කටයුතු කිරීම, විදුලි කාර්මික සහායක හා පුස්තකාල සහායිකා යන තනතුරුවල රාජකාරි ඉටු කරමින් තිබුණි. තවද වැඩ ක්ෂේත්‍ර කම්කරුවකු පරිගණක දත්ත ක්‍රියාකාරිණියක ලෙස සේවයේ යොදවා තිබුණි.

**3.2 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

---------------------------------

සභාවට කසළ කළමනාකරණය සම්බන්ධයෙන් විධිමත් වැඩපිළිවෙලක් නොතිබුණු අතර, දෛනිකව එකතු කරන කසළවලින් දිරන කසළ හොරතොට කන්ද ඉඩමේ වලවල් කපා ඒ තුළට බැහැර කර, පස්වලින් වසා දැමීම සිදුකර, නොදිරන කසළ සභාවේ කඩ කාමර තුළ ගොඩගසා තිබුණි. එමෙන්ම දැනට කසළ බැහැර කරමින් පවතින ඉඩමට පරිසර බලපත්‍රයක් ලබා ගැනීමට ද කටයුතු කර නොතිබුණි.

**3.3 වත්කම් කළමනාකරණය**

----------------------------

**නිෂ්ක්‍රීය / ඌණ උපයෝජිත වත්කම්**

----------------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) රු.5,012,888 ක මුදලකින් 2013 වර්ෂයේ දී වැඩ නිමකර තිබුණු ඉමදූව මාවැල්ල ඉඩමේ ආදාහනාගාරයේ දහන කුටීරය 2014 දෙසැම්බර් 26 දින සිට ක්‍රියා විරහිත වී තිබුණි. අළුත්වැඩියාවන් සිදුකර, 2016 මාර්තු 26 දින සිට වැඩ ආරම්භ කළද, 2016 දෙසැම්බර් 31 දින වනවිට නැවත අක්‍රීයව තිබුණි.

(ආ) 2014 දෙසැම්බර් 20 දින රාජ්‍ය පරිපාලන, පළාත් සභා පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලැබී තිබුණු පිරිවැය රු.6,009,602 ක් වූ ටිපර් රථය සභාවට ලැබුණු දින සිටම ධාවනය සඳහා යොදවා නොගෙන, ගාල්කර තිබූ අතර, පිරිවැය රු.1,030,000 ක් වූ ටාටා වර්ගයේ කැබ් රථය ධාවනයට යොදවා නොගෙන ආදාහනාගාර රථ ගාලේ නවතා තබා තිබුණි.

(ඇ) රාජ්‍ය ආයතනවල අබලන් වූ වාහන භාවිතයෙන් ඉවත් කිරීම සම්බන්ධයෙන් වූ මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ අංක 02/2015 දරන 2015 ජූලි මස 10 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු නොකර සභාව සතු පිරිවැය රු.1,959,000 ක් වූ වාහන 03 ක් නිශ්කාර්යව තබා තිබුණි.

**4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

-----------------------------------------

**4.1 අයවැය පාලනය**

-------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැය ලේඛනයේ ඇතුළත් වියදම් විෂයයන් 08 ක එකතුව රු.28,451,459 ක් වූ ඉතිරිවීම් ද, තවත් විෂයයක රු.11,357 ක් වූ අහිතකර විචලනයන් ද, ආදායම් විෂයයන් 08 ක එකතුව රු.26,288,365 ක් වූ ළඟාකර නොගත් ඉලක්ක ආදායම් ද පැවැතීම නිසා අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

**4.2 නොවිසඳී ඇති හා පිළිතුරු නොදුන් විගණන විමසුම්**

-----------------------------------------------------------

ඉකුත් වර්ෂය සඳහා වූ විගණකාධිපති වාර්තාවේ 2.2.1 ඡේදයේ (ඇ), (උ), (ඌ), (ඒ), 4.2 (ඇ), (ඇ), 4.5 සහ 4.6 යන ඡේදයන්ගෙන් පෙන්වා දුන් අඩුපාඩු නිවැරදි කිරීමට එකඟ වී තිබුණු නමුත්, සමාලෝචිත වර්ෂයේදී ද අදාළ නිවැරදි කිරීම් කර නොතිබුණි.

**4.3 අභ්‍යන්තර විගණනය**

----------------------

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 133 හා 134 හි විධිවිධාන හා පළාත් පාලන කොමසාරිස්ගේ (දකුණු පළාත) 2014 පෙබරවාරි 24 දිනැති අංක : දපපා/යහ/01/නා.ව.ලේ දරන චක්‍රලේඛය ප්‍රකාරව අභ්‍යන්තර විගණන නිලධාරියෙක් පත්කර තිබුණ ද, ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

**4.4 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම**

-----------------------------------------------------------

2009 ජූනි 09 දිනැති අංක DMA/2009(i) දරන කලමනාකරණ විගණන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි.

**5. පද්ධති හා පාලන**

--------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර විගණන විමසුම් මඟින් සභාවේ අවධානයට යොමු කරන ලදී. පහත විස්තර දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

| | පද්ධතිය | | පද්ධතියේ ප්‍රධාන අඩුපාඩු |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් | | නිෂ්ක්‍රීයව පවතින ආදාහනාගාරය සහ යන්ත්‍ර සූත්‍ර අළුත්වැඩියා කර, භාවිතයට ගෙන නොතිබුණි. |
| (ආ) | වාහන පාලනය | (i) | සභාව සතු වාහනවල ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. |
| | | (ii) | ඇතැම් වාහන කිසිදු ප්‍රයෝජනවත් කාර්යයකට යොදවා නොගෙන දිරාපත් වෙමින් පැවැතුණි. |
| | | (iii) | වාහනවලට අදාළ ලොග් සටහන් පොත් නඩත්තු කර නොතිබුණි. |
| (ඇ) | ආදායම් රැස්කිරීම | (i) | හිඟ ආදායම් අයකර ගැනීම සඳහා විධිමත් වැඩ පිළිවෙලක් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| | | (ii) | කුරුඳු වගාවේ අස්වනු නෙලීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සකසා නොතිබුණි. |
| | | (iii) | 1999 වර්ෂයෙන් පසුව නව වරිපනම් තක්සේරු ලබාගෙන නොතිබුණි. |
| | | (iv) | කඩ කාමරවල අයිතිය නිරවුල් කර, බදු දීමට කටයුතු කර නොතිබුණි. |
| | | (v) | සංවර්ධිත ප්‍රදේශවලින් වරිපනම් අයකර ගෙන නොතිබුණි. |
| (ඇ) | ගිණුම්කරණය හා ලේඛන පැවැත්වීම | (i) | ඉකුත් වර්ෂවල සිට ඉදිරියට එන ගිණුම් ශේෂ නිරවුල් කර නොතිබුණි. |
| | | (ii) | දේශීය ණය සංවර්ධන අරමුදලේ ණය සම්බන්ධයෙන් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| | | (iii) | සභාව විසින් සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණි.<br><br>• හානි හා පාඩු ලේඛනය<br>• ණයහිමි ලේඛනය<br>• ණයගැති ලේඛනය<br>• පරිගණක, උපාංග හා මෘදුකාංග සම්බන්ධ ස්ථාවර වත්කම් ලේඛනය |
| | | (iv) | වත්කම් පන්ති අනුව වෙන් වෙන්ව විස්තර දැක්වෙන පරිදි ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| | | (v) | සභාවට පවරා දී ඇති ඉඩම් හා ගොඩනැගිලි ගිණුම්ගත කර නොතිබුණි. |
| | | (vi) | වාහනවලට අදාළ විස්තර ඇතුළත් කර, ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| (ඉ) | සේවක මණ්ඩල කළමනාකරණය | (i) | අතිරික්ත කාර්යය මණ්ඩලය විධිමත් කර |

| | | | |
|---|---|---|---|
| | | | ගැනීමට මෙන්ම පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| | | (ii) | තනතුරට අදාළ නොවන රාජකාරි පැවරීම් සිදුකර තිබුණි. |
| (ඊ) | අයවැය පාලනය | (i) | වාර්ෂික අයවැය ලේඛනය මඟින් ප්‍රතිපාදන වෙන් කරවාගෙන තිබුණු වියදම් විෂයයන් 08 ක ඉතිරිවීම් දක්නට ලැබුණි. |
| | | (ii) | වියදම් විෂයයක අනුමත සීමාවන් ඉක්මවා වියදම් දරා තිබුණි. |
| | | (iii) | ආදායම් විෂයයන් 08 ක අහිතකර විචලනයන් පැවැතීමෙන් ආදායම් ඉලක්ක ලඟා කරගෙන නොතිබුණි. |